# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2003 අංක 23 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2003 ජූලි මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2003 අගෝස්තු මස 01 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 5.50 යි. තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

**2003 අංක 23 දරන මට්ටු ඇල්ලීම සහ සුදු බදු (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2003 ජූලි මස 30 වන දින.]

එල්. ඩී.– ඕ. 62/2002.

**1988 අංක 40 දරන මට්ටු ඇල්ලීම සහ සුදු බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2003 අංක 23 දරන මට්ටු ඇල්ලීම සහ සුදු බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 40 දරන මට්ටු ඇල්ලීම සහ සුදු බදු පනතේ 7 වන වගන්තියේ "සුදු" යන යෙදුමේ අර්ථ නිරූපණයෙහි "විංග්-එට්-උම්, වීල් ඔෆ් ෆෝචූන්" යන වචන වෙනුවට "විංග්-එට්-උම්, රූලට් හෝ වීල් ඔෆ් ෆෝචූන්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. 1988 අංක 40 දරන පනතේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. 2002 අංක 11 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

(1) ඒ උපලේඛනයෙහි I වන කොටසේ "රුපියල් පන්ලක්ෂයක්" යන වචන වෙනුවට "රුපියල් තිස් දහසක්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ උපලේඛනයෙහි II වන කොටස ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"II වන කොටස

මෙහි I වන තීරුවෙහි නිශ්චිතව සඳහන් සෑම වර්ෂයක් සඳහා ම යම් තැනැත්තකු ගෙවනු ලැබිය යුතු බද්ද, මෙහි නිශ්චිතව II වන තීරුවෙහි අනුරූප සටහනෙහි නිශ්චිතව සඳහන් මුදල හා සමාන මුදලක් විය යුතු ය—

2—H 018080—4,500 (2003/05)

(අ) සූදු ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා -

| I වන තීරුව *වර්ෂය* | II වන තීරුව *බදු මුදල* |
|---|---|
| 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 2001 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් ම සඳහා | රුපියල් මිලියන එකයි ; |
| 2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන වර්ෂය සඳහා | රුපියල් මිලියන විසිපහයි ; |

(ආ) (රූජිනෝ ක්‍රීඩාව කිරීම හැර) සූදු ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා -

| | |
|---|---|
| 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන සෑම වර්ෂයක් ම සඳහා | රුපියල් මිලියන දොළහයි ; |

(ඇ) රූජිනෝ ක්‍රීඩාව පමණක් ක්‍රීඩා කිරීමෙන් ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා -

| | |
|---|---|
| 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන සෑම වර්ෂයක් ම සඳහා | රුපියල් පන්ලක්ෂයයි. |

ආපසු ගෙවීම.

**4.** 2002 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු ව ආරම්භ වන වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ බදු ගෙවීමට යටත්ව සිටි යම් තැනැත්තකු විසින් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ දිනයට පෙරාතුව කොමසාරිස් ජනරාල්වරයා වෙත ඒ බදු මුදල ගෙවනු ලබන අවස්ථාවක, තත් කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයා වෙත කරනු ලබන ඉල්ලීමක් මත මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති බද්දට වැඩියෙන් ගෙවන ලද මුදල ආපසු ලබා ගැනීමට ඒ තැනැත්තාට හිමිකම් තිබිය යුතු ය.

වගකීමෙන් නිදහස් කිරීම.

**5.** 2002 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන වර්ෂය සඳහා, ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ බදු ගෙවීමට යටත්ව සිටි යම් තැනැත්තකු විසින්, මේ පනත ක්‍රියාත්මක වීම

ආරම්භ වන දිනයේ දී ඒ බදු මුදල ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක, මේ පනත යටතේ විධිවිධාන සලස්වා ඇති පරිදි අය විය යුතු බදු මුදල ඒ තැනැත්තා විසින් ගෙවනු ලබන්නේ නම්, එම පනතේ විධිවිධාන ඒ තැනැත්තා විසින් කඩ කර ඇති බවට සලකනු නොලැබිය යුතු ය.

**6.** මේ පනත මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන, සියලු කාර්යයන් සඳහා 2002 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය. අතීතයට බලපෑම.

**7.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.